**සැ. යු. -** 2018.02.02 වැනි දින පළ වූ අංක 2057 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,059 - 2018 පෙබරවාරි මස 16 වැනි සිකුරාදා - 2018.02.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 166 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 166 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


***සැ. යු.*** - අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2018 පෙබරවාරි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 මාර්තු මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 පෙබරවාරි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

165 – B 081252 — 403 (2018/02)

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

MOD/DEF/10/03/WTD/6/2017.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉවත් කිරීම

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදා අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ෆ්ලයිට් ඔෆිසර් දිසානායක මුදියන්සේලාගේ හාතිය කාංචන දිසානායක (03107) - පරිපාලන - 2017.12.22

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

02 - 492

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2017 දෙසැම්බර් මස 15 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. රාජරත්න විසින් ලියා සහතික කරන ලද 2012 ජූලි මස 09 දිනැති හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ඩබ්ලිව්. මීගහවෙල විසින් ලියා සහතික කරන ලද 2012 ජූලි මස 10 දිනැති අංක 1779/391 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, කටුගස්තොට පදිංචි ඉලංගන් මුදියන්සේලාගේ යටවරගෙදර සුනිල් යටවර සහ ඉලංගන් මුදියන්සේලාගේ යටවර ගෙදර කාන්චනා උදයංගනී යටවර සහ බත්තරමුල්ලේ පදිංචි ඉලංගන් මුදියන්සේලාගේ යටවරගෙදර උදය කුමාර යටවර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2017 සැප්තැම්බර් මස 29 වැනි දිනට එකී ඉලංගන් මුදියන්සේලාගේ යටවරගෙදර සුනිල් යටවර සහ ඉලංගන් මුදියන්සේලාගේ යටවරගෙදර කාන්චනා උදයංගනී යටවර සහ ඉලංගන් මුදියන්සේලාගේ යටවරගෙදර උදය කුමාර යටවර යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත එකී අංක 1779/391 දරන උකස් බැඳුම්කරය මත රුපියල් තිස් නව ලක්ෂ හැටපන් දහස් හයසිය හැට හයයි ශත අනූ පහක (රු. 3,965,666.95) මුදලක් ද, 2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් තිස් පන් ලක්ෂ පනස් හය දහස් පන්සිය නවයයි ශත අසූ හතරක (රු. 3,556,509.84) මුදල මත සෑම වසකරම තුන් මසකට වරක්, ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකය (ඒඩබ්ලිව්ආර් ස්ථානීය)ට ඉහළින් සියයට අටක් (8%) වූ පොලී අනුපාතිකය මත වන වැඩිදුර පොළිය ද, අයවිය යුතුව හා ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් තිස් නව ලක්ෂ හැටපන් දහස් හයසිය හැට හයයි ශත අනූ පහක (රු. 3,965,666.95) මුදලක්ද, 2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා

රුපියල් තිස් පන් ලක්ෂ පනස් හය දහස් පන්සිය නවයයි ශත අසූ හතරක (රු. 3,556,509.84) මුදල මත සෑම වසකරම තුන් මසකට වරක්, ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකය (ඒඩබ්ලිව්ආර් ස්ථානීය)ට ඉහළින් සියයට අටක් (8%) වූ පොලී අනුපාතිකය මත වැඩිදුර පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහතකී අංක 1779/391 දරන උකස් බැඳුම්කරය මගින් ඉලංගන් මුදියන්සේලාගේ යටවරගෙදර සුනිල් යටවර විසින් ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරන ලද ඉඩම, ගොඩනැගිලි සහ පරිශ්‍රය ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම, කොළඹ බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතුයයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 1779/391 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ කෝරළේ, පල්ලේතලවින්නේ පිහිටි තොටුපොල වත්ත නොහොත් කරගස්ගොඩ වත්ත නොහොත් කරවිගස්ගොඩවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. විජේවර්ධන විසින් සාදන ලද 1990 නොවැම්බර් මස 19 දිනැති අංක 4343 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු ඩී. එම්. ජයරත්න විසින් 2012.06.20 වැනි දින මායිම් සහ ප්‍රමාණය සනාථ කරන ලදී) මායිම් උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : කරවිගස්ගොඩහේන ද, දකුණු-නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 3 ද, දකුණට : එකී පිඹුරේ ලොට් 3 ද සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 1 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0)ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේද සමග වේ.

ලක්ෂමන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

02 - 566

**සම්පත් බැංකුව පී. එල්. සී.**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගිණුම් හිමියාගේ නම : සී. ඩබ්ලිව්. එස්. ෆොන්සේකා
ගිණුම් අංක : 1029 5380 7780.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017 ජූලි මස 27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගමේ ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් 2016 ඔක්තෝබර් මස 18 දාතම හා අංක 00042552484 දරන හිමිකම් සහතිකය යටතේ එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 12 දාතම දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබා දුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොම්පඤ්ඤගේ වරුණ සංජීව ෆොන්සේකා යන අය බන්ධනාදයීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද එකී අංක 00042552484 දරන හිමිකම් සහතිකය යටතේ එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 12 දතම දරන එකී උකස් බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැත්තෑ අට ලක්ෂ විසි එක් දහස් අනූ හයයි ශත හැට හයක (රු. 7,821,096.66) මුදලක් 2017 ජූලි මස 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් හැත්තෑ අට ලක්ෂ විසි එක් දහස් අනූ හයයි ශත හැට හයක (රු. 7,821,096.66) මුදලද, 2017 ජූලි මස 03 වැනි දින සිට එකී අංක 00042552484 දරන හිමිකම් සහතිකය යටතේ එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 12 දතම දරන එකී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ තුන් ලක්ෂ පනස් අට දහස් හත්සිය පනස් අටයි ශත හැත්තෑ හතක (රු. 7,358,758.77) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහයි බිංදුවක් (13.50%) බැගින් වූ පොළියද, දන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 00042552484 දරන හිමිකම් සහතිකය යටතේ එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 12 දතම දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ,

කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මොරටුව මහ නගර සභා සීමාවන් තුළ කටුබැද්ද ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ කටුබැද්ද ග්‍රාමයේ පිහිටි ඉඩම් කොටසට සර්වේයර් ජෙනරාල් විසින් සාදන ලද කැඩැස්තර සිතියම් අංක 520205 (බ්ලොක් අංක 9) දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 296 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ඉඩම් කැබලි අංක 97 ද, නැගෙනහිරට : ඉඩම් කැබලි අංක 297 ද, දකුණට : ඉඩම් කැබලි අංක 125 ද, සහ බස්නාහිරට : ඉඩම් කැබලි අංක 95 සහ 96 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි බිංදුවයි හතරක් (හෙක්ටයාර 0.0304) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී කැඩැස්තර සිතියම් අංක 520205 දරන පිඹුරට අනුව හිමිකම් ලියාපදිංචි අංක 00042552484 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී කැඩැස්තර සිතියම් අංක 520205 දරන එකී නිරූපිත ලොට් 125 මගින් යටින් හා දිගේ අනෙකුත් සම්බන්ධ අයිතීන් සහ ගමන් කිරීමේ හා මාර්ග අයිතීන් ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 583/1

---

**සම්පත් බැංකුව පී. එල්. සී.**

**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ) 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය**

ගිණුම් හිමියාගේ නම : ජී. එස්. ආර්. විතානාරච්චි සහ ජේ. ආර්. එන්. පී. ඒ. බී. එම්. එස්. එන්. කේ. බිබිලේ.
ගිණුම් අංක : 0161 5000 0185.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2017 ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගමේ ලියාපදිංචි අංක පීකිව් 144 දරන කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් වැල්ලවාය ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. එම්. තෙන්නකෝන් යන අය විසින් ලියා සහතික කරන ලද 2012 සැප්තැම්බර් මස 20 දතම හා අංක 1888 දරන සහ බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2016 මැයි මස 12 දතම හා අංක 1609 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපලවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගජනායක සුරංග රුක්මන් විතානාරච්චි සහ ජයසුන්දර රාජකරුණා නවරත්න පන්ඩිත අත්තනායක බණ්ඩාරනායක මුදියන්සේලාගේ සුනේත්‍රා නිල්මිණි කුමාරි බිබිලේ යන අය බන්ධනදායින් වශයෙන් හා එකී ගජනායක සුරංග රුක්මන් විතානාරච්චි යන අය උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින්ද, එකී අංක 1888 සහ 1609 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස් හය ලක්ෂ දහසය දහස් හාරසිය පනස් හතරයි ශත හතලිස් නමයක (රු. 5,616,454.49) මුදලක 2017 ඔක්තෝබර් මස 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් පනස් හය ලක්ෂ දහසය දහස් හාරසිය පනස් හතරයි ශත හතලිස් නමයක (රු. 5,616,454.49) මුදලක් 2017 ඔක්තෝබර් මස 11 වැනි දින සිට අංක 1888 සහ 1609 දරන එකී බැඳුම්කර මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි ලක්ෂ අසූ එක් දහස් දෙසිය පනහක (රු. 2,081,250) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%), රුපියල් තිස් එක් ලක්ෂ තිස් හතර දහස් හයසියයක (රු. 3,134,600) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three per centum (3%) per annum (floor rate 14% per annum) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1888 සහ 1609 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය කොට්ඨාසය හි වෙගම්පත්තු කෝරළේ (වෙල්ලස්ස) බිබිලේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බිබිලේ ග්‍රාමයේ පිහිටි "සිටි ගාර්ඩන් නොහොත් බිරියාබැද්දේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන, එච්. එම්. සිරිසේන උණවටුන යන

අය විසින් සාදන ලද 2009 අප්‍රේල් මස 16 දතම (2009 පෙබරවාරි මස 25 වැනි දින - 27 වැනි දින මනින ලද සහ උප බෙදුමක් ලෙස) හා අංක 797 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 20 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ ලොට් 19 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර ද, සහ බස්නාහිරට : පාර සහ ලොට් 21 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම බිංදුවයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 12.02) හෝ හෙක්ටයාර 0.0304 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 797 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 101/268 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 797 දරන එකී පිඹුරේ ලොට් 51 A සහ 51 E වශයෙන් නිරූපිත පාර භාවිතා කිරීමේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

02 - 583/2

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

නන්දන ස්ටෝර්ස්.
ගිණුම් අංක : 0145 1000 0405

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017.10.26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2014 ජනවාරි මස 02 දතම හා අංක 689 දරන, 2015 මාර්තු මස 31 දතම හා අංක 1153 දරන, 2015 සැප්තැම්බර් මස 29 දතම හා අංක 1363 දරන සහ 2016 පෙබරවාරි මස 02 දතම හා අංක 1477 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "නන්දන ස්ටෝර්ස්" යන ව්‍යවහාරික නාමය යටතේ කරගෙන යන හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන හේරත් මුදියන්සේලාගේ ජගත් කුමාර, හේරත් මුදියන්සේලාගේ ගාමිණි හේරත් සහ හේරත් මුදියන්සේලාගේ නිහාල් හේරත් යන අය බන්ධනදයින් වශයෙන් හා එකී හේරත් මුදියන්සේලාගේ ජගත් කුමාර, හේරත් මුදියන්සේලාගේ ගාමිණි හේරත්, හේරත් මුදියන්සේලාගේ නිහාල් හේරත් සහ හේරත් මුදියන්සේලාගේ ජයන්ත හේරත් යන අය උකස්කරුවන් වශයෙන්ද පැහැර ඇති හෙයින් ද, එකී අංක 689, 1153, 1363 සහ 1477 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තුන් කෝටි හැට දෙලක්ෂ හතළිස් නව දහස් තුන්සිය හතයි ශත අසූ නමයක (රු.36,249,307.89) මුදලක් 2017 ඔක්තෝබර් 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන් කෝටි හැට දෙලක්ෂ හතළිස් නම දහස් තුන්සිය හතයි ශත අසූනමයක (රු. 36,249,307.89) මුදල ද, 2017 ඔක්තෝබර් මස 11 වැනි දින සිට අංක 689, 1153, 1363 සහ 1477 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් පනස් ලක්ෂ හය දහස් එකසියයක (රු. 5,006,100) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) සහ තවත් රුපියල් දෙකෝටි අනූ හතර ලක්ෂ අසූ අට දහස් පන්සිය හැත්තෑවයි ශත හැට හයක (රු. 29,488,570.66) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 689, 1153, 1363 සහ 1477 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙනදේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කොට්ඨාසයේ, බුත්තල කෝරළේ, බුත්තල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මීගහවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මීගහවෙල ග්‍රාමයේ පිහිටි "වෙර අරාවේ වත්ත, වැලි ආර මූකලාන සහ වැලි ආර කුඹුර" (T.P. 244031 සහ 322816) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ෆුවාඩ් ඉස්මයිල් යන අය විසින් සාදන ලද 1976 දෙසැම්බර් මස 20 දතම හා අංක 1060 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙද වෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර සඳහා වෙන්කිරීම, නැගෙනහිරට : ජේ. එම්. කුලතිලක යන අය විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ කොටසක්, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් මෙම මායිම් හී දිග අඩි 120ක් සහ පළල අඩි 35ක් යන කොටසට සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්‍රිරුව M 8/158 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත ඉඩම් කොට නව මිනුමට අනුව පහතින් විස්තර වේ.

එකී මීගහවෙල ග්‍රාමයේ පිහිටි "වෙර අරාවේ වත්ත, වැලි ආර මූකලාන සහ වැලි ආර කුඹුර" (T.P. 244031 සහ 322816) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානත තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2011 මැයි මස 21 දතම හා අංක MO/9229 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදවෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සඳහා වෙන්කිරීම (H), නැගෙනහිරට : ජේ. එම්. කුලතිලක යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : මෙම ඉඩමේ ලොට් B සහ බස්නාහිරට : ජේ. එම්. කරුණාරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 15.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක MO/9229 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව J 01/119 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 583/3

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නාලද සම්මුතිය

සෙවන්ටීන් සී සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0113 1000 0509.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017.09.28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් වැල්ලවාය ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. එම්. තෙන්නකෝන් යන අය විසින් ලියා සහතික කරන ලද 2014 ඔක්තෝබර් මස 30 දාතම හා අංක 2428 දරන සහ බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. ඒ. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2016 පෙබරවාරි මස 02 දාතම හා අංක 1484 දරන සහ 2007 අප්‍රේල් මස 21 දාතම හා අංක 2045 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 61979 දරන සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන සෙවන්ටීන් සී සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදයීන් වශයෙන් පැහැර ඇති හෙයින් ද.

එකී අංක 2428, 1484, සහ 2045 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් දෙකෝටි හැට හත් ලක්ෂ හැත්තෑ නමදහස් අටසිය හතයි ශත අනූහතරක (රු. 26,779,807.94) මුදලක් 2017 සැප්තැම්බර් මස 03 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි හැට හත් ලක්ෂ හැත්තෑ නම දහස් අටසිය හතයි ශත අනූ හතරක (රු.26,779,807.94) මුදලද, 2017 සැප්තැම්බර් මස 04 වැනි දින සිට අංක 2428 1484, සහ 2045 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක (රු.15,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් අනූ දෙලක්ෂයක (රු. 92,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2428, 1484, සහ 2045 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතුයයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ බියන්විල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඉහළ බියන්විල සහ පහළ බියන්විල පිහිටි මංකඩ පාර වරිපනම් අංක 61/5 දරන ''දඹුගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. එෆ් ජේ. පෙරේරා යන අය විසින් සාදන ලද 1984 සැප්තැම්බර් මස 29 දාතම හා අංක 9027 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : එච්. ඇසිලින් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ කොටසක්, ගිණිකොනට : මෙම ඉඩමේ කොටසක්, නිරිතට : මෙම ඉඩමේ කොටසක් සහ වයඹට : ලොට් 2 (අඩි 12 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (A. 0, R. 0, P. 30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක. 9027 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව N 308/08 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එච්. එම්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 මාර්තු මස 17 දාතම හා අංක 2750 දරන මැතකදී කරන ලද මිනුමකට අනුව ඉහත ඉඩම විස්තර කරනු ලැබ ඇති අතර එය පහත සඳහන් පරිදිය.

එකී ඉහළ බියන්විල පිහිටි මංකඩ පාර වරිපනම් අංක 61/5දරන ''දඹුගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 මාර්තු මස 17 දතම හා අංක 2750 දරන පිඹුරේ නිරූපිත සීමානිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් අංක 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : එච්. ඇසිලින් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ කොටසක්, ගිණිකොනට : මෙම ඉඩමේ කොටසක්, නිරිතට : මෙම ඉඩමේ කොටසක් සහ වයඹට : අංක 9027 දරන පිඹුරේ ලොට් 2 (අඩි 12 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) හෝ හෙක්ටයාර 0.0759 ක් විශාල ඉම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමඟ එකී අංක 2750 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව N308/08 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 584

---

## කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් (ලියාපදිංචි අංක පීබී 4847)බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය :
සප්පානි චන්ද්‍රසේකර් සහ නලිනි නටාෂා චන්ද්‍රසේකර්.
කේම්බ්‍රිජ් ට්‍රේඩර්ස් හි හවුල්කරුවෝ.

කේම්බ්‍රිජ් ට්‍රේඩර්ස් හි හවුල්කරුවන් වූ සප්පානි චන්ද්‍රසේකර් (ජා. හැ. අංක 602010082V) සහ නලිනි නටාෂා චන්ද්‍රසේකර් (ජා. හැ. අංක 698163798V) බන්ධනදයීන් වශයෙන් වූ කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් බැංකුවේ නමට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. සෝලංගආරච්චි ගුණතිලක විසින් සහතික කරන ලද වර්ෂ 2014 ක් වූ ඔක්තෝබර් මස 23 වැනි දිනැති අංක 476 දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, වර්ෂ 2017 ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දිනට කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් බැංකුවට, රුපියල් මිලියන තිස් අටයි හැට දෙදහස් හත්සිය අසූ තුනයි ශත දහ හතරක් (රු. 38,062,783.14) අයිරා පහසුකම වෙනුවෙන් ද, රුපියල් මිලියන විස්සයි එක් ලක්ෂ හැට නව දහස් අටසිය පනස් දෙකයි ශත අනූ නවයක් (රු. 20,169,852.99) ආනයන ණය පහසුකම වෙනුවෙන් ද, රුපියල් මිලියන හතරයි හය ලක්ෂ අනූහත් දහස්, නවසිය විසි පහයි ශත දහ නවයක් (රු. 4,697,925.19) බිල්පත් ලැබීම් පහසුකම වෙනුවෙන් ද එකී බැඳුම්කරය අනුව කාර්ගිල් බැන්ක් ලිමිටඩ් බැංකුවට දනට ලැබිය යුතුව ඇති හෙයින් ද, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, 1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් දෙන ලද බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරන වගනම්, මෙහි උපලේඛනයෙහි වඩාත් සවිස්තරව විස්තර කෙරෙන්නා වූ ද අංක 476 දරන බැඳුම්කරය මගින් කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් බැංකුවට උකස් කරනු ලැබූවා වූ ද දේපළ සහ පරිශ්‍ර, එකී අයිරා පහසුකම වෙනුවෙන් වූ රුපියල් මිලියන තිස් අටයි හැට දෙදහස් හත්සිය අසූ තුනයි ශත දහහතර (රු. 38,062,783.14), රු. 38,062,783.14 මුදල මත වර්ෂයකට 24% ක වැඩිදුර පොලිය සමඟ අයකර ගැනීමට ද, රුපියල් මිලියන විස්සයි එක් ලක්ෂ හැට නව දහස් අටසිය පනස් දෙකයි ශත අනූ නවයක් (රු. 20,169,852.99) රු. 14,6763,601.76 මුදල මත වර්ෂයකට 16% ක වැඩිදුර පොලිය සමඟ අයකර ගැනීමට ද, රුපියල් මිලියන හතරයි හය ලක්ෂ අනූහත් දහස් නවසිය විසි පහයි ශත දහ නවයක් (රු. 4,697,925.19), රු. 3,439,666.80 මුදල මත වර්ෂ 2017 ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දින සිට මේ දක්වා වර්ෂයකට 13% ක වැඩිදුර පොලිය සමඟ අයකර ගැනීමට ද ඒ සමගම දැන්වීම් වියදම සහ වෙනත් වැ වූ ගාස්තු, පසුව ලැබුණු යම් මුදලක් වෙතොත් එය අඩු කර අයකර ගැනීමට ද ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බව ය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මාලිගාකන්ද ග්‍රාම නිලධාරී වසම තුළ අංක 27 දරන මාලිගාකන්ද කොට්ඨාසයේ, ශ්‍රී වජිරඥාන මාවත දිගේ පිහිටි ශ්‍රී විජරඥාන මාවතේ දනට වරිපනම් අංක 71 දරන බලයලත් මිනින්දෝරු ඩී. ජී. එම්. පී. ප්‍රනාන්දු විසින් සාදන ලද වර්ෂ 1996 ක් වූ පෙබරවාරි මස 06 වන දිනැති අංක 5017 දරන පිඹුරේ X සහ Y දරන ඉඩම් කට්ටිවල සහ වර්ෂ 1996 ක්වූ පෙබරවාරි මස 06 වැනි දිනැති අංක 5016 දරන පිඹුරේ H කට්ටියේ ඒකාබද්ධ කිරීමක් වන්නා වූ බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද වර්ෂ 1998 ක් වූ අගෝස්තු මස 31 වන දිනැති අංක 750 දරන පිඹුරේ X ඉඩම් කට්ටිය ලෙස සලකුණු කළ බෙදු නිශ්චය කළ ඉඩම් කොටස. එකී X දරන ඉඩම් කැබැල්ල මායිම්, උතුරට : මරදාන පොලිස් සථානයෙන් ද, නැගෙනහිරට ශ්‍රී වජිරඥාන මාවතේ වරිපනම් අංක 77 න් ද, දකුණට : ශ්‍රී වජිරඥාන මාවතෙන් සහ Y දරන ඉඩම් කට්ටියෙන් ද, බස්නාහිරට : Y දරන ඉඩම් කොටසින් සහ ශ්‍රී වජිරඥාන මාවතේ වරිපනම් අංක 63 දරන ස්ථානයෙන් ද, මායිම් වූ එකී අංක 750 දරන පිඹුර ප්‍රකාරව, ප්‍රමාණයෙන් පර්චස් විසිනවයයි දශම හතරයි පහක් (අ. 0, රූ.0, පර්. 29.45) වූ ඉඩම් කොටස මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම ඩී 80/55 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්ලිව්. කේ. එෆ්. ද සිල්වා,
සමාගම් ලේකම්.

02 - 602